# සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල-2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂිකව සතුන් ප්‍රත්‍යාගණනය කරන බව ගිණුම් ප්‍රතිපත්ති මගින් හෙළිදරව් කළද, අලි ඇතුන් හැර අනෙක් සතුන් ඓතිහාසික පිරිවැයට අගය කර තිබිණි.

(ආ) පින්නවල සහ දෙහිවල අලි ඇතුන් අගය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබ අගයන් අතර එක් ලකුණකට රු. 270,000 ක් වූ වෙනසක් නිරීක්ෂණය වූ නමුත්, ඒ සඳහා හේතුවූ කරුණු හෙළිදරව් කර නොතිබිණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) පෙර වර්ෂවල උපචිත වියදම් වශයෙන් දක්වා නොතිබ රු. 45,538,032 ක වියදම් 2012 වර්ෂයේ බැදීම් ලෙස දක්වා වර්ෂය තුළදී ගෙවා තිබිණි.

(ආ) 2012 වර්ෂය වෙනුවෙන් 2013 වර්ෂයේදී වැයකර තිබ රු. 5,365,988 ක් වූ වියදම් වෙනුවෙන් 2012 වර්ෂයේදී ගිණුම්වල ප්‍රතිපාදනයන කර නොතිබිණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආනයනය කළ සතුන් වෙනුවෙන් රු. 743,735ක් රේගු ගාස්තු ලෙස වැයකර තිබුණද අරමුදලේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර තිබුණේ රු. 243,735 ක ගාස්තුවක් පමණි. දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු. 500,000 ක් ගිණුම්ගත කර තිබිණි.

(ඇ) ප්‍රවේශපත් කවුළු වෙත නිකුත් කළ පිරිවැය රු. 261,903 ක් වූ (මුහුණත වටිනාකම රු. 43,580,850 ක් වූ) ඉතිරි ප්‍රවේශපත් තොගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සුභසාධක ආපනශාලාව සඳහාවූ විදුලි වියදම් පියවීමේදී රු. 251,790 ක මුදලක් ආපනශාලා කළමනාකාරත්වයෙන් ලැබිය යුතු වූවද, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී රු. 3,049,123 ක් වටිනා සමරු භාණ්ඩ තොග කපාහැර තිබණි. කපාහැරීම් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබ අතර, මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබණි.

සත්වෝද්‍යාන අධ්‍යක්ෂවරයාගේ පිළිතුර අනුව නැවත සිදුකරන ලද තොග අගය කිරීමේදී 2011 දෙසැම්බර් 31 දිනට තොගය රු. 5,604,251 ක් වූ බවත්, ඒ අනුව තොග අඩුවීම රු. 896,814 ක් පමණක් වන බවත් සඳහන් කර තිබණි. ඒ අනුව කපාහැරීම්වල වෙනස සඳහා වූ ගැලපීම් 2013 වර්ෂයේදී සිදුකරන බවද දන්වා තිබණි.

කෙසේ වූවද, 2012 වර්ෂයේ මිලදී ගැනීම් සහ විකිණීම්ද ඉතිරි තොගයට ගැලපූ පසු 2012 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම රු. 5,238,733 ක් ලෙස ගණනය කළ හැකි අතර, ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණු තොග වටිනාකම රු. 2,824,799 ක් වී තිබුණි.

(උ) සුභසාධක ආපනශාලාව වෙනුවෙන් විදුලි බිල්පත් පියවීමේදී දෙවරක් ගෙවීම් කිරීම නිසා විදුලිබල මණ්ඩලයට රු. 452,198 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ සෙවන අරමුදල නමින් රු. 500,000 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පෙන්වා තිබූ නමුත්, එය නිරවුල් කිරීමට හෝ අවශ්‍ය ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද පියවර ගෙන නොතිබුණි.

### 1.2.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුභසාධක ආපනශාලාව සඳහා මාසිකව රු. 20,000 ක් විදුලි වියදම් සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළද, ඒ සඳහා වූ ලිඛිත ගිවිසුමක් ඉදිරිපත් නොවුණි.

(ආ) 2012 පෙබරවාරි 10 දින රේගුව මගින් රාජසන්තක කිරීමෙන් පසුව ආරක්ෂා කර ගැනීම සඳහා ජාතික සත්වෝද්‍යානයට භාරදුන් පක්ෂීන් 98 දෙනෙකු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝගය මත නැවත අයිතිකරුට ආපසු ලබාදීමේදී සත්වෝද්‍යානය වැය කළ මුදල ලෙස අය කළ රු. 985,000 ක මුදල විවිධ ආදායම් ලෙස

ගිණුම්ගත කර තිබණි. එම මුදල ගණනය කළ පදනම පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබණි.

1.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 110 | මියගය සතුන් සම්බන්ධයෙන් හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 156 (2) | විධිමත් ක්‍රමවේදයකින් තොරව රු. 300,000 ක් වටිනා එළුවන් 37 දෙනෙකු ජාතික පශු සම්පත් මණ්ඩලයට නොමිලේ ලබාදී තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 397,537,423 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ශුද්ධ අතිරික්තය රු. 373,338,296 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 24,199,127 කින් වර්ධනයවී තිබණි. සත්වෝද්‍යානයට පරිත්‍යාග වශයෙන් ලද ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. 17,178,529 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ සමස්ථ ආදායම රු. 1,105,592 කින් වර්ධනයවී තිබ අතර, වියදම රු. 23,093,536 කින් අඩුවී තිබුණි. තවද, සමස්ථ ප්‍රවේශ පත්‍ර ආදායම පසුගිය වර්ෂයේ ආදායමට සාපේක්ෂව රු. 17,896,110 කින් අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය

ප්‍රකාශන විශ්ලේෂණාත්මකව සමාලෝචනය කිරීමේදී අනාවරණය වූ වැදගත් සංඛ්‍යාත්මක දත්තයන් පහත දැක්වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| | % | % |
| සමස්ථ ප්‍රවේශ පත්‍ර ආදායම මත සමස්ථ ලාභය | 63 | 58 |
| සමස්ථ ආදායම මත ප්‍රවේශ පත්‍ර ආදායම | 94 | 96 |
| සමස්ථ ආදායම මත විවිධ ආදායම | 06 | 04 |
| සමස්ථ ආදායම මත සමස්ථ වියදම | 39 | 44 |
| ජංගම වත්කම් (භාණ්ඩාගාර තැන්පතු ශේෂය හැර) මත සමරු භාණ්ඩ තොගය | 14 | 29 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 නරඹන්නන්ගේ පැමිණීම සහ ආදායම්

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයෙහි දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව සහ එමගින් ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානය

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු: | | රු: |
| දේශීය | 1,412,062 | 110,039,210 | 1,689,755 | 130,922,050 |
| විදේශීය | 21,188 | 25,108,000 | 20,446 | 25,178,750 |
| එකතුව | 1,433,250 | 135,147,210 | 1,710,201 | 156,100,800 |

දෙහිවල සත්වෝද්‍යානයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සසඳන විට පුද්ගලයින් 742 කින් හෙවත් සියයට 3.6 කින් වැඩිවී තිබුණු අතර, එමගින් ලද ආදායම රු. 70,750 කින් හෙවත් සියයට 0.3 කින් වැඩිවී තිබුණි. එසේම දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව හා ආදායම පිළිවෙලින් පුද්ගලයින් 277,693 කින් සහ රු. 20,882,840 කින් අඩුවී තිබුණි. මේ අනුව ඉදිරියේදී නරඹන්නන්ගේ සංඛ්‍යාව වර්ධනය කරගැනම සඳහා නව වැඩසටහන් හඳුන්වා දියයුතු බව නිරීක්ෂණය විය.

(ආ) <u>පින්නවල අලි අනාථාගාරය</u>

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු: | | රු: |
| දේශීය | 497,157 | 36,083,510 | 463,982 | 34,053,050 |
| විදේශීය | 266,297 | 455,554,750 | 264,452 | 448,625,000 |
| එකතුව | 763,454 | 491,638,260 | 728,434 | 482,678,050 |

පින්නවල අලි අනාථාගාරයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුද්ගලයින් 1845 කින් හෙවත් සියයට 0.69 කින් වැඩිවී තිබ අතර, එමගින් ලද ආදායම රු. 6,929,750 කින් වැඩිවී තිබණි. දේශීය නරඹන්නන් සංඛ්‍යාව හා එමගින් ලද ආදායම ඉකුත් වර්ෂයට වඩා පිළිවෙලින් පුද්ගලයින් 33,175 කින් හා රු. 2,030,460 කින් වැඩිවී තිබණි.

වර්ෂයේ මුළු ප්‍රවේශ පත් ආදායමෙන් සියයට 78 ක පින්නවල අලි අනාථාගාරයේ ප්‍රවේශ පත්‍ර ආදායමෙන් නියෝජනය විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලට ආධාර වශයෙන් සංචාරක මණ්ඩලයෙන් රු. 22,634,131 ක් ලැබී තිබ අතර එම මුදල් පින්නවල අලි අනාථාගාරයේ වැසිකිළි පද්ධතිය සකස් කිරීම සඳහා යොදවා තිබණි. මෙම ආධාර මුදල් ලබාදීමේදී වර්ෂයකට විදේශ ප්‍රවේශ පත් 1000 ක් බැගින් සංචාරක මණ්ඩලයට ලබාදිය යුතු බවට සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති දන්වා තිබ නමුත්, එම ටිකට්පත් කොපමණ කාලයක් සඳහාද, කුමන පුද්ගලයකුගේ අනුමැතිය මත එසේ ලබාදිය යුතු දැයි යන කරුණු සළකා බැලීමකින් තොරව සත්වෝද්‍යාන අධ්‍යක්ෂ විසින් ඒ සඳහා අනුමැතිය ලබාදී තිබණි. එසේ ලබාදීමෙන් වර්ෂයකට සත්වෝද්‍යානයට අහිමි වන ආදායම රු. 2,000,000 ලෙස තක්සේරු කළ හැකිය.

(ආ) සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආපන ශාලාව 2009/10 වර්ෂයේදී බදුදීමට ලංසු කැඳවීමේදී ඉදිරිපත් කළ ප්‍රධාන නිර්නායකය වයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, භෝජනාගාර සේවා/හෝටල් හිමියන් යන්න වුවත් 2012/13 වර්ෂයේදී එම නිර්නායකය ඉවත් කර පිළිගත් සුදුසුකම් ලැබ, ආපනශාලා/වෙළෙඳ කුටි පවත්වාගෙන යෑම පිළිබඳ වසර 03 ක පළපුරුද්දක් ඇති පුද්ගලයන් ලෙස වෙනස් කර තිබණි. මෙලෙස

ලංසුකරුවන්ගේ සුදුසුකම් පහත හෙලීම නිසා විදේශකයන් ඇතුළු නරඹන්නන් සඳහා ඉහළ ගුණත්වයෙන් යුතු ආහාර හා බීම වර්ග ඇතුළු උසස් සේවාවන් සැපයීම සඳහා සුදුසු ලංසුකරුවකු සහභාගී කර ගැනීමට නොහැකිවී තිබුණි.

දෙවන ලංසු කැඳවීම වෙළෙඳ පොළ මිල සැසඳුනුම් ක්‍රමය (Shopping Method) මගින් තෝරාගත් ලංසුකරුවන් 12 දෙනෙකු වෙත දැනුම්දීමක් සිදුකර තිබ නමුත්, එම අවස්ථාවේදී ඉලක්ක කරන ලද ලංසුවක් ඉදිරිපත් නොවීම නිසා ප්‍රතික්ෂේපවී තිබුණි.

2012 මාර්තු 08 දින අළුත්වැඩියා කටයුතු නිමකර සත්වෝද්‍යානය වෙත භාරදී තිබ එම ආපනශාලාව 2013 ජූලි 15 දින දක්වාම ඉහත පරිදි සුදුසු ලංසුකරුවකු තෝරාගත නොහැකිවීම නිසා මහජනයා සඳහා විවෘත නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ගෝනපල ගොවිපල සහ සත්වෝද්‍යානය අතර සතුන් මාරු කිරීමේදී විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි.

අධ්‍යක්ෂවරයාගේ පිළිතුර අනුව 2013 වර්ෂයේ සිට ගොවිපලවල් අතර සතුන් මාරු කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන බව දන්වා තිබුණි.

(ඈ) සමරු භාණ්ඩ අලෙවි සැලෙහි අලෙවි කිරීමට කාලෝචිත සමරු භාණ්ඩ හඳුන්වාදී නොතිබූ අතර, ඉදිරිපත් කර තිබ භාණ්ඩවල අලෙවිය බෙහෙවින් අඩුවීම මත අලෙවි සැලෙහි ආදායම අඩුවී තිබුණි.

## 04 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම - 2012

2012 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් කාර්තුව සඳහා මුදල් වෙන් කිරීම ප්‍රතිශත වශයෙන් පමණක් පෙන්වා තිබූ අතර, මුදල්මය වටිනාකම සඳහන් කර නොතබුණි. ඒ අනුව එම ක්‍රියාකාරී සැලැස්ම ආයතනයේ වාර්ෂික ඉලක්කයන් පැහැදිලිව හා නිවැරදිව දක්වන ලියවිල්ලක් ලෙස සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

### 4.2 කාර්ය සාධන වාර්තා අනුව කාර්යය සාධනය - 2012

සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් ව්‍යාපෘති සඳහා අපේක්ෂිත මුළු වියදම, තථ්‍ය මුළු වියදම හා ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය යන තොරතුරු සකස් කිරීමට අරමුදල පියවර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යන් අනුව පමණක් වර්ෂයේ මුදල් වෙන් කිරීම දක්වා තිබුණ අතර, කාර්යන්හි වියදම හා එහි භෞතික ප්‍රගතිය හෝ මූල්‍ය ප්‍රගතිය, වෙන් වෙන් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා නොතිබුණි.

සකස් කර තිබූ ක්‍රියාකාර සැලැස්ම අනුව ව්‍යාපෘති 04 ක කටයුතු 2012 දෙසැම්බර් 31 වනවිට අවසන් කළයුතු වූවද, එදිනට එම කාර්යයනහි ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය.

## 4.3 අභ්‍යන්තර විගණනය

2012 වර්ෂය සඳහා අරමුදල විසින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.4 අයවැය පාලනය

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. 425,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ නමුත්, තථ්‍ය වියදම රු. 349,792,198 ක් වූයෙන් ඉතිරිය රු. 75,207,802 ක් හෙවත් සලසා තිබ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 17 ක් වී තිබණි.

(ආ) පින්නවල නව සත්වෝද්‍යානය, හම්බන්තොට සෆාරි උද්‍යානය හා දෙහිවල සත්වෝද්‍යානයේ ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු මගින් මූලිකව ප්‍රතිපාදන සලසා තිබුණ අතර, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු වැය ශීර්ෂය මගින්ද එම ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන සලසා තිබණි. නමුත්, ව්‍යාපෘතිය යටතේ අදාල කාර්යයන් වෙන් වෙන්ව හඳුනාගෙන මදල් වෙන්කර නොතිබුණි. මේ නිසා ප්‍රාග්ධන වියදම්වලට අදාල ඉදිකිරීම්වල අගය නිවැරදිව හඳුනාගත නොහැකිවී තිබුණි.

## 05. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයට යොමු කළයුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ලේඛන පවත්වාගෙන යාම
(ඈ) මිලදී ගැනීම හා සත්ව ආහාර සැපයීමේ ක්‍රියාවලිය
(ඉ) මුද්‍රිත ප්‍රවේශ පත්‍ර තොග ලේඛනගත කිරීම
(ඊ) සමරු කළඹ විකිණීම හා තොග පාලනය
(උ) සතුන් අගය කිරීම හා මියගිය සතුන් වෙනුවෙන් වාර්තා පවත්වාගෙන යාම
(ඌ) වාහන පාලනය